**පළාත් මාර්ග ව්‍යාපෘතිය - ඌව පළාත - 2014**

-----------------------------------------------

පළාත් මාර්ග ව්‍යාපෘතිය - ඌව පළාත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී.ලං.ර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජා.සං.සං) අතර 2010 ජනවාරි 11 දින එළඹි අංක 4630 එල්කේ දරන ණය ගිවිසුමේ 4.09(ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------

පළාත් මාර්ග ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, ඌව, නැගෙනහිර හා උතුරු පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන අතර එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ, පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ වැඩිදියුණු කළ මාර්ග යටිතල පහසුකම් පිළිබඳ තිරසාර කළමනාකරණය මගින් ප්‍රතිග්‍රාහක ඌව, නැගෙනහිර හා උතුරු පළාත්වල සමාජ, ආර්ථික මධ්‍යස්ථාන සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ල ප්‍රකාරව, ව්‍යාපෘතියේ - ඌව පළාතේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 67.2 කට සමාන රු. මිලියන 7,592 ක් වන අතර, ඉන් එ.ජ.ඩො. මිලියන 60 කට සමාන රු.මිලියන 6,800 ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජා.සං.සං) විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 මාර්තු 31 දින ආරම්භ කරන ලද අතර, 2015 මාර්තු 31 දින වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පිරිපාටි වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම

අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍යයැයි සලකණු ලැබූ පරික්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව,

(ආ) මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති වියදම්, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග ප්‍රමාණවත් පරිදි සැසඳීම්කර තිබේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව,

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව,

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වුයේ ද යන බව,

**1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙන් දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයෙන් දක්වා ඇති කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැරුණු විට, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) පෙර වර්ෂයේ මාගේ විගණන වාර්තා මගින් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

රු.මිලියන 729 ක අලාභ ඉල්ලා කොන්ත්‍රාත්කරුවෙකු විසින් ගොණුකර තිබූ බේරුම්කරණ නඩුව හේතුවෙන් ඇතිවිය හැකි අසම්භාව්‍ය බැරකම් පිළිබඳ අවශ්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශණවල සිදුකර නොතිබුණි.

**2.2.2 නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම.**

පහත දැක්වෙන අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | බද්දට යටත් මාණ්ඩලික නිලධාරීන් 09 දෙනෙකුගේ එකතුව රු.421,704 ක උපයන විට ගෙවීමේ බදු අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) | 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 6(1)(අ) සහ 12 වගන්තිය | රු.මිලියන 5 ඉක්මවන පොදු කොන්ත්‍රාත් 102 ක් කොන්ත්‍රාත්කරුවන් විසින් පොදු කොන්ත්‍රාත් රෙජිස්ටාර්වරයා වෙත ලියාපදිංචි කර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි නොවූ කොන්ත්‍රාත්කරුවන් වෙත කොන්ත්‍රාත් පිරිනැමීම මගින් ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු නිලධාරීන් විසින් දඩුවම් ලැබිය යුතු වරදක්ද සිදුකර තිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 756 හා 757 | ව්‍යාපෘතිය ප්‍රසම්පාදනය කළ වත්කම් සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකර නොතිබුණ අතර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි. |

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යනය, අයවැයගත වෙන්කිරීම් සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනයට අදාල, වැදගත් සංඛ්‍යාලේඛණ කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍යනය කිරීම සඳහා ණය ගිවිසුම අනුව එකඟ වූ මුදල | | අරමුදල් උපයෝජනය: 2014 වර්ෂය තුළ | | අරමුදල් උපයෝජනය: 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ජා.සං.සං | 60 | 6,800 | 9.24 | 1,206.00 | 51.72 | 6,413.31 |
| ශ්‍රී.ලං.ර | 7.2 | 792 | - | 393.74 | - | 705.94 |
| එකතුව | 67.2 | 7,592 | 9.24 | 1,599.74 | 51.72 | 7,119.25 |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) 2004 වර්ෂයේදී සිදුකරන ලද ශක්‍යතා අධ්‍යයනය පදනම් කරගෙන පිළියෙල කරන ලද වැඩ හා පිරිවැය ඇස්තමේන්තු අනුව 2010 වර්ෂයේදී සිවිල් වැඩ සඳහා කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත් වැඩවල විෂය පථය හා පිරිවැය සැලකිය යුතු ලෙස වෙනස් වී තිබුණි. එම නිසා, ව්‍යාපෘති කාලය අවසානයේ සමස්ත ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 584 කින් ඉහළ ගොස් තිබුණි.

(ආ) ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය ලබා ගන්නා ආයතන සඳහා නිකුත්කර ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව මුල් පිරිවැය ඇස්තමේන්තුවෙන් සියයට 15 ඉක්මවන මිල වෙනස්වීම් සඳහා ණය දෙන ආයතනයේ අනුමැතිය ලබාගත යුතු නමුත් කෝට්ටෙගොඩ - පොදුමිල්ල - අදියාරවත්ත - මස්පන්න - යාලගමුව මාර්ගය පුනරුත්ථාපන වැඩ සඳහා අවස්ථා 09 කදී සිදුකළ රු.මිලියන 237.2 ක මිල වෙනස්වීම් සඳහා ජාත්‍යන්තර සංවර්ධන එජන්සියේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) ගලඋඩ - කන්දෙකැටිය - කරමැටිය මාර්ගය පුනරුත්ථාපනයේදී කාණු පද්ධතිය නිසි ලෙස ඉදිනොකිරීමෙන්, 2012 ඔක්තෝබර් වන විට වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණද 2014 දෙසැම්බර් 31 දින වන විටත් මාර්ග පුනරුත්ථාපන වැඩවල ප්‍රගතිය සියයට 87.5 ක් පමණක් විය. එසේම පුනරුත්ථාපන වැඩ නිසි පරිදි සැලසුම් නොකිරීමෙන්, පවුල් 138 ක් පානීය ජලය ලබාගන්නා ජල සම්පාදන යෝජනා ක්‍රමයකට හා කුඹුරු අක්කර 41 කට වැසි ජලයෙන් අහිතකර බලපෑම් සිදුවී තිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් මාසයේ ඇති වූ අධික වර්ෂාව හේතුවෙන් මැඩිකැලේ - පතනවත්ත - තැන්නපංගුව - කිරිවෙහෙර මාර්ගයේ ඇතැම් ස්ථාන නිසි ජල පරිවහන පද්ධතියක් සහ බෝක්කු ආදිය නොමැතිවීම නිසා දැඩිලෙස සෝදාපාළුවට ලක්ව තිබූ බව ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය සතුව ප්‍රමාණවත් යන්ත්‍රෝපකරණ සහ විධිමත් නඩත්තු වැඩසටහනක් නොමැතිවීම නිසා මාර්ග නඩත්තු කටයුතු ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

**3.3 මතභේදයට තුඩුදෙන කරුණු**

--------------------------------

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) ව්‍යාපෘති නිලධාරීන්ගේ භාවිතය සඳහා කොන්ත්‍රාත්කරුවකු මගින් චාරිකා නිවාසයක් කුලී පදනම මත ලබාගෙන ඒ සඳහා රු.1,636,291 ක් කුලී ලෙස සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. නමුත් වාර්තාවලට අනුව සමාලෝචිත වර්ෂයේදී එම චාරිකා නිවාසය ව්‍යාපෘති නිලධාරීන් විසින් දින 47 ක් පමණක් භාවිතා කර තිබුණි.

(ආ) මාර්ග පුනරුත්ථාපන වැඩවල ශක්‍යතාව තහවුරු කර ගැනීමට අදාල වැඩිදුර තොරතුරු ලංසුකරු වෙතින් කැඳවීමකින් තොරව, ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා 32% අඩුවෙන් එනම් රු.මිලියන 767.33 කට ලංසු ඉදිරිපත් කළ විදේශ බද්ධ ව්‍යාපාරයක් සහිත ලංසු ඉදිරිපත්කළ කොන්ත්‍රාත්කරුවකුට ගලඋඩ - කන්දකැටිය - කරමැටිය මාර්ගයේ පුනරුත්ථාපන වැඩ ප්‍රදානය කර තිබුණි. තවද, බද්ධ ව්‍යාපාර ගිවිසුම ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කර නොතිබුණි. මාර්ග පුනරුත්ථාපන වැඩ කඩිනම් කිරීමට ඌව පළාත් ප්‍රධාන ලේකම් උපදෙස් ලබාදී තිබියදීත් මාර්ග පුනරුත්ථාපන කටයුතුවල ප්‍රගතිය සැලසුම්ගත ඉලක්ක අනුව ඉටුකර නොතිබුණි. එසේම ප්‍රමාද ගාස්තු ලෙස අය කරගත් රු.මිලියන 42 ක මුදල වලංගු හේතු නොමැතිව නැවත කොන්ත්‍රාත්කරුවෙත ගෙවා තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය සමඟ මතුව ඇති ආරවුල් හේතුවෙන් රු.මිලියන 729 ක අලාභ ඉල්ලා බේරුම්කරන නඩුවක් ගොණුකර තිබුණි. මෙම තත්ත්වයට විකල්ප ක්‍රියාමාර්ගයක් ලෙස කොන්ත්‍රාත්තුව නිම කිරීම ප්‍රමාද කිරීම මත සිදුවූ අලාභ සම්බන්ධයෙන් ප්‍රති අලාභ ඉල්ලීමක් සිදුකර නොතිබුණි.

(ඇ) ලංසු වලංගු කාල සීමාව තුළ ලංසු ඇගයීම් සිදුකර ලංසු ප්‍රදානය නොකිරීම නිසා අතිරේක ගාස්තු ලෙස ලංසු වටිනාකමින් සියයට 6 ක් එනම් රු.මිලියන 18.63 ක් කොන්ත්‍රාත්කරුවන් 05 දෙනෙකු වෙත ගෙවා තිබුණි. ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවීම, ව්‍යාපෘතියේ උපදේශකයන් හා කාර්ය මණ්ඩලය පත්කිරීම ප්‍රමාද වීම සහ පරිපූරක ණය ගිවිසුම් අත්සන් කිරීම ප්‍රමාද වීම වැනි හේතු නිසා එම මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘති ප්‍රමාද වී ආරම්භ කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘති මුදල් අපේක්ෂිත අරමුණු වෙනුවෙන් වැඩදායක ලෙස උපයෝජනය කර නොතිබුණි.

(ඈ) කොන්ත්‍රාත් මුළු පිරිවැය මුදලින් 6.9% ක් නියෝජනය වූ එකතුව රු.මිලියන 299.3 ක් ව්‍යාපෘති උපදේශකවරුන් සහ ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයේ කාර්ය මණ්ඩලය සඳහා නවාතැන් හා ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් කොන්ත්‍රාත් 06 ක ප්‍රමාණ බිල්පත් වල ඇතුළත් කර ඇති බව නිරීක්ෂණය විය. උපදේශක සමඟ එළඹුණු ගිවිසුම අනුව, වාහන 15 ක් උපදේශක වෙත සැපයිය යුතුව තිබුණි. නමුත් වාහන 25 ක් සපයා තිබූ අතර, ඒ සඳහා රුපියල් මිලියන 50.5 ක අතිරේක මුදලක් වැය කර තිබුණි.

**3.4 මූල්‍ය පාලන දුර්වලතාවයන්**

----------------------------

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව අනුව, ව්‍යාපෘතියේ ගණුදෙනු සම්බන්ධව අභ්‍යන්තර විගණනයන් සිදු කිරීම අපේක්ෂා කෙරුණි. නමුත් රේඛීය අමාත්‍යාංශය විසින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර නොමැති අතර එම වාර්තා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනය හා ණය නියෝජිතායතනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ඌව පළාතේ පළාත් මාර්ග නඩත්තු කිරීම සඳහා 2011 සිට 2014 දක්වා වූ කාලය තුළ වෙන්කරන ලද රු.මිලියන 2,600 ක මුදලින් රු.මිලියන 2.121 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

**3.5 ව්‍යාපෘතියේ අරමුණු කරා ලඟා වීම**

**----------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයනයන් අනුව ඌව පළාතේ පුනරුත්ථාපනය කළ මාර්ග වල පොදු ප්‍රවාහන පද්ධතියේ සාමාන්‍ය මගී ප්‍රවාහන කාලය අඩුකිරීම තුළින් ඌව පළාත තුළ ප්‍රජා ප්‍රවාහන පද්ධතියෙහි මට්ටම වැඩි දියුණු කිරීමට අපේක්ෂාකර තිබුණි. නමුත් ඌව පළාත් සභාව විසින් මාර්ග ප්‍රතිසංස්කරණයට පෙර හා පසු ගමන් කිරීමට ගතවන කාලය තක්සේරු කිරීම හා මාර්ග ප්‍රතිසංස්කරණයෙන් පසු පළාත් සභාව යටතේ පාලනය වන මගී ප්‍රවාහන සේවා බස් රථ කාලසටහන් සංශෝධනය කිරීමට ඌව පළාත් සභාව විසින් පියවර ගෙන නොතිබිණි.

(ආ) ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයන වාර්තාව මගින් මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන තිබුණද එම පද්ධතිය ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.